"විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු."

# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
# பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
# OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதம செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011-2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011-2092601
ඊ-මේල් / ஈ-மெயில் / Email chiefsecretary@wpc.gov.lk
සාමාන්‍ය දුරකථන / தொலைபேசி / General Telephone 011-2093000

| | | | |
|---|---|---|---|
| මගේ අංකය. / எனது இல. / My No. | CSWP/ADM/18-38/FI/01-2019 | ඔබේ අංකය. / உமது இல. / Your No. | |
| දිනය. / திகதி. / Date. | 2019-04-24 | | |

ආණ්ඩුකාර ලේකම්(බ.ප),
ලේකම්,පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව(බ.ප.),
සභා ලේකම්(බ.ප),
සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්(බ.ප),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්(පාලන/පිරිස් හා පුහුණු/මුල්‍ය/සැලසුම්/ඉංජිනේරු),
පළාත් ආදායම් කොමසාරිස්(බ.ප.),
ප්‍රධාන අභ්‍යන්තර විගණක (අභ්‍යන්තර විගණන අංශය),
පරිපාලන නිලධාරි(පාලන),
ප්‍රධාන ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම්/ පරිපාලන නිලධාරි,

<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/88(I), 03/2019, 02/2019, 06/2019, හා 05/2019 බස්නාහිර පළාතට අදාල කර ගැනීම.</u>

රාජ්‍ය පරිපාලන හා ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද පහත සඳහන් චක්‍රලේඛ බස්නාහිර පළාතට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමැතිය ලබා දී ඇති බව ආණ්ඩුකාර ලේකම්ගේ අංක GOS/ADM/02/19/01/2019 හා 2019.04.18 දිනැති ලිපිය මගින් මා වෙත දන්වා ඇත.(එම චක්‍රලේඛ පිටපත් මේ සමඟ අමුණා ඇත.)

| අනු අංකය | චක්‍රලේඛ අංකය හා දිනය | කාරණය |
|---|---|---|
| 01. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 21/88(I), 2019-01-29 | ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන්, රාජකාරියේ යෙදී සිටියදී තුවාල ලබන/ නිත්‍ය වශයෙන් ආබාධිත වන රජයේ නිලධරයන්ට/ පළාත් රාජ්‍ය සේවයේ නිලධරයන්ට/ රාජ්‍ය සංස්ථා සේවකයන්ට වෛද්‍යාධාර දීමනා/ වන්දි ගෙවීම සහ ත්‍රස්තවාදී ප්‍රචණ්ඩ ක්‍රියා හේතුවෙන් මරණයට පත්වන එවැනි නිලධරයන්ගේ/ සේවකයන්ගේ යැපෙන්නන්ට වන්දි ගෙවීම |
| 02. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 03/2019, 2019.02.20 | ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ 19:5 උප වගන්තිය යටතේ වූ විනය පරීක්ෂණ නිලධර නාම ලේඛනය |
| 03. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2019, 2019-02-22 | සම්පූර්ණ වැටුප් සහිතව ලබා ගත් නිවාඩුවක අනිවාර්ය සේවා කාලයක් තුළ සේවය කරමින් සිටින නිලධරයකුට වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබා දීම |



| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதம செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුල්‍ය / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதான உள்ளகக் கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel: 011-2092606 Fax: 011-2092609 | Tel: 011-2092631 Fax: 011-2092647 | Tel: 011-2092640 Fax: 011-2092636 | Tel: 011-2092532 Fax: 011-2092533 | Tel: 011-2092501 Fax: 011-2092505 | Tel: 011-2092628 |

| අනු අංකය | චක්‍රලේඛ අංකය හා දිනය | කාරණය |
|---|---|---|
| 04. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2019, 2019-02-27 | 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන අනුව ආයතන සංග්‍රහයේ I වැනි කාණ්ඩයේ වගන්ති සංශෝධනය කිරීම |
| 05. | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ ලිපි අංක 05/2019, 2019.03.05 | දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳීම සම්බන්ධයෙන් වන ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 2:3:2 උප වගන්තිය සංශෝධනය කිරීම |

02. එකී චක්‍රලේඛ පරිදි කටයුතු කරන ලෙසත් ඔබ යටතේ සිටින සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්, ආයතන ප්‍රධානීන් හා නිලධාරීන් දැනුවත් කරන ලෙසත් කාරුණිකව ඉල්ලා සිටිමි.

එන්.එන්. සූරියආරච්චි,
සහකාර ප්‍රධාන ලේකම් (පාලන),

අත්/කලේ.: ප්‍රදීප් යසරත්න.
ප්‍රධාන ලේකම්,
බස්නාහිර පළාත.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 02/2019

මගේ අංකය : EST-06/03/LEA/3161(2)
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2019.02.22

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>සම්පූර්ණ වැටුප් සහිතව ලබා ගත් නිවාඩුවක අනිවාර්ය සේවා කාලයක් තුළ සේවය කරමින් සිටින නිලධරයකුට වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබා දීම</u>**

ආයතන සංග්‍රහයේ XV වැනි පරිච්ඡේදයේ 5 වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එම වගන්තිය පහත උප වගන්ති ඇතුළත් කරමින් සංශෝධනය කිරීමට 2018.09.18 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

5:3 සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩු ලබා ගෙන ඊට නියම වන අනිවාර්ය සේවා කාලය තුළ සේවය කරමින් සිටින නිලධරයකුට තමා දැනට ලබා සිටින ඉහළම පශ්චාත් උපාධි සුදුසුකමට වඩා ඉහළ සුදුසුකමක් සහිත අධ්‍යයනයක් සඳහා මෙහි XII වැනි පරිච්ඡේදයේ 15 හෝ 16 වගන්ති යටතේ වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබාදිය හැක. එසේ නිවාඩු ලබා ගන්නා අවස්ථාවක දී නිලධරයා දැනට බැඳී සිටින ගිවිසුමට අමතරව 9 වැනි පරිශිෂ්ටයේ දක්වා ඇති ගිවිසුමට ද ඇතුළත් විය යුතුය.

5:3:1 වැටුප් රහිත අධ්‍යයන නිවාඩු අවසන් කර නිලධරයා නැවත සේවයට වාර්තා කළ පසු අධ්‍යයන නිවාඩු ලබා දෙන අවස්ථාව වන විට මුල් ගිවිසුමේ තවදුරටත් සේවය කිරීමට ඉතිරිව තිබූ අනිවාර්ය සේවා කාලය සහ දෙවැනි ගිවිසුම යටතේ සේවය කිරීමට බැඳුණු අනිවාර්ය සේවා කාලය යන දෙකෙහි එකතුවට සමාන මුළු අනිවාර්ය සේවා කාලයම මෙහි 4:10 උප වගන්තිය මඟින් නියම කර ඇති උපරිම වසර 10 ක සීමාව නොසලකා රජය වෙනුවෙන් සේවය කළ යුතුය.

5:3:2 නිලධරයා අධ්‍යයනය සඳහා යවන විට ඔහු සම්පූර්ණ කළ යුතු අනිවාර්ය සේවා කාලය ඔහුගේ අනිවාර්ය විශ්‍රාම යාමේ වයස එළැඹීමට ප්‍රථම සම්පූර්ණ කිරීමට ප්‍රමාණවත් කාලසීමාවක් තිබෙන බවට වගබලා ගැනීම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වගකීම වන්නේය.

5:3:3 සම්පූර්ණ වැටුප් සහිත අධ්‍යයන නිවාඩුවක් වෙනුවෙන් රජය සමඟ ගිවිසුමකට බැඳී සිටින නිලධරයකුට නියම වී ඇති අනිවාර්ය සේවා කාලය සම්පූර්ණ කිරීමකින් තොරව විදේශ රැකියා සඳහා නිවාඩු ලබා දිය නොහැක.

ජේ.ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා
ආපදා කළමනාකරණ අමාත්‍යාංශය